# මතුගම අධ්‍යාපන කලාපය

## විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

| 7 ශ්‍රේණිය | ජෛව ක්‍රියාවලිය | ඒකකය - 12 |
|---|---|---|

**නිවැරදි පිළිතුරු තොරන්න.**

1. ජීවයේ සරලතම කෘත්‍යමය ඒකකය වන්නේ ,

    (I) සෛලය (II) පටකය (III) අවයවය (IV) පද්ධතිය

2. ඒක සෛලික ජීවියකු නොවන්නේ

    (I) ඇමීබා (II) පැරමීසියම් (III) මාළුවා (IV) යුග්ලිනා

3. ශාක දේහයට අයත්විය හැක්කේ ,

    (I)ජීර්ණ පද්ධතිය (II)මුල පද්ධතිය (III) ශ්වසන පද්ධතිය (IV) බහිස්‍රාවී පද්ධතිය

4. මිනිසා ලබාගන්නා සංකීර්ණ ආහාර සරල ආහාර බවට පත් කරන පද්ධතිය ,

    (I) ශ්වසන පද්ධ (II) බහිස්‍රාවී පද්ධතිය (III) ප්‍රජනන පද්ධිය (IV) ආහාර ජීර්ණ පද්ධතිය

5. ආහාර ජීර්ණ පද්ධතියට අයත් අවයවයක් නොවන්නේ ,

    (I) ශ්වාසනාලය (II) ග්‍රසනිකාව (III) ආමාශය (IV) කුඩා අන්ත්‍රය

6. ආහාර මාර්ගයටත් ස්වසන මාර්ගයටත් පොදු කුටීරය වන්නේ ,

    (I) මුඛ කුහරය (II) අන්නස්‍රෝතය (III) ග්‍රසනිකාව (IV) ගුදය

7. ආහාර ජීර්ණය සම්පූර්ණ වී ජීර්ණඵල අවශෝෂණය වන්නේ ,

    (I) කුඩා අන්ත්‍රයේ දී (II) ආමාශය (III) අක්මාව (IV) මහාන්ත්‍රය

8. ජීවින්ගේ ශක්තිය ජනනය වන ක්‍රියාවලිය ,

    (I) ප්‍රජනනය (II) ශ්වසනය (III) බහිස්‍රාවය (IV) ආහාර ජීර්ණය

9. ශ්වසනයේ දී නිපදවෙන අතුරුඵලයන් වන්නේ ,

    (I) ඔක්සිජන් (II) නයිට්‍රජන් (III) කාබන්ඩයොක්සයිඩ් (IV) මුත්‍රා

10. ශ්වසන පද්ධතියකට අයත් වායු හුවමාරුව සිදුවන අවයවය වන්නේ ,

    (I) පෙනහැලි (II) ස්වරාලය (III) ශ්වාසනාලය (IV) නාස් කුටීරය

## B කොටස - රචනා

01)

I. සත්ත්ව දේහයේ ව්‍යුහමය ඒකකය කුමක් ද? (ල . 2)

II. ඔබ ශාක සෛල නිරීක්ෂණයට භාවිතා කළේ කුමන ශාකයක සෛලද? (ල . 2)

III. ඒක සෛලික ජීවින් දෙදෙනෙකු නම් කරන්න (ල . 2)

IV. ඒක සෛලික ජීවීන් නිරීක්ෂණයට ඔබ ලබා ගත් නියැදි 2 ක් ලියන්න (ල . 2)

V. ජීවි දේහයේ සංවිධාන මට්ටම් පිළිවෙළින් නම් කරන්න (ල . 2)

**02) වඩාත්ම ගැලපෙන ලෙස යා කරන්න.**

| | |
|---|---|
| I. ජීවයේ තැනුම් ඒකකය | පටකය |
| II. සෛල සමූහයක් ඒකරාශි වී සකස්වන සංවිධාන මට්ටම | සෛලය |
| III. පටකවල ලක්ෂණයකි | ශෛලම පටකය |
| IV. සත්ත්ව දේහයේ දක්නට ලැබෙන පටක වර්ගය | පොදු කාර්යයන් ඉටු කිරීම |
| V. ශාකයක ජලය පරිවහනය කරන පටකය | රුධිර පටකය |

(ල .10)

03)

I. ශාකයක ඇති පටක වර්ග 2 ක් නම් කරන්න. (ල . 2)

II. එම පටක මගින් කෙරෙන කාර්යයන් ලියන්න. (ල . 2)

III. පද්ධතියක් යනු කුමක් ද? (ල . 2)

IV. ආහාර ජීර්ණ පද්ධතියට අයත් අවයව 2 ක් නම් කරන්න (ල . 2)

V. ශාකයක ඇති ප්‍රධාන පද්ධති දෙක නම් කරන්න. (ල . 2)

04)

I. මිනිස් දේහය තැනී ඇති ප්‍රධාන පද්ධතිය 2 ක් ලියන්න. (ල . 2)

II. ආහාර ජීර්ණය යනු කුමක් ද? (ල . 2)

III. ආහාර ජීර්ණ පද්ධතියෙන් සිදුවන කාර්යයන් 2 ක් ලියන්න. (ල . 2)

IV. ශ්වසනය යනු කුමක්ද? (ල . 2)

V. ශ්වසන පද්ධතියේ ආකෘතියක් නිර්මාණය කිරීමට ඔබ භාවිත කල ද්‍රව්‍ය 4 ක් ලියන්න. (ල. 2)